# ගොවිපොළ යාන්ත්‍රීකරණයේ පවතින තත්ත්වය පිළිබඳ විමසුමක් ...

**පසුබිම**

කාර්මික විප්ලවය හරහා බ්‍රිතාන්‍යයන් රෝදය සොයා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය කෙරෙහි මිනිසුන්ගේ අවධානය යොමු වන්නට විය. මිනිසාගේ එදිනෙදා ජීවිතයේ බොහෝ කාර්යයන් සරල තත්ත්වයකට පත්වන්නට විය. පසු කලෙක මෙම තාක්‍ෂණික මෙවලම්වල බලපෑම කෘෂි කාර්මික අංශය කෙරෙහි ද යොමු වන්නට විය. කෘෂි අංශය තුළ මුලින් ම යන්ත්‍ර සූත්‍ර භාවිතය ආරම්භ වූයේ 19 වන සියවසේ මුල් භාගයේ දී බ්‍රිතාන්‍ය තුළ යි. ඒ විශාල වශයෙන් සිදු කෙරුණු ඉරිඟු වගාව සඳහා යි. 1920 ට පෙර යුගයේ මහා බ්‍රිතාන්‍යයේ සිදු වූ ආර්ථික අවපාතයත්, නැපෝලියන්ගේ ආක්‍රමණයත් හේතුවෙන් ගොවීන් තම ශ්‍රමිකයින්ට අඩු වැටුප් ගෙවීමෙන් තම ලාභය ඉහළ නංවා ගැනීමේ නැඹුරුවත් දැකගත හැකි විය. එනම් අඩු පිරිවැය මත පදනම් වූ නිෂ්පාදන ක්‍රමවේදයන් කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු වන්නට විය. ඒ තුළ වැඩි ලාභයක් ඉපයීමේ පරමාර්ථයෙන් යන්ත්‍ර සූත්‍ර භාවිතයට මොවුන්ගේ අවධානය යොමු විය. එහි ප්‍රතිඵලයක් ලෙස කෘෂි අංශය යාන්ත්‍රීකරණය ආරම්භ විය.

ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය සඳහා විශේෂයෙන් ම වී ගොවිතැනේ බිම් සැකසීමේ කටයුතු සඳහා යොදා ගනු ලැබුවේ ගවයින් හා මී ගවයින් ය. එහෙත් පසුව ජනගහනයේ වර්ධනයත් සමග ම වැඩි වී අස්වැන්නක අවශ්‍යතාවය දැනෙන්නට වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ගොවි ජනපද ව්‍යාපාර ආරම්භ වන්නට විය. ඒ 1930 හා 1940 ගණන්වල ය. එහි දී විශාල කැලෑ බිම් ගොවි බිම් බවට පරිවර්තනය කිරීමේ දී මිනිස් ශ්‍රමයට වඩා කාර්යක්ෂම යන්ත්‍රෝපකරණවල අවශ්‍යතාවය දැනෙන්නට වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ට්‍රැක්ටර් භාවිතය (රෝද 4 ට්‍රැක්ටර්) ආරම්භ වන්නට විය. ජනපද ව්‍යාපාරය ආරම්භයේ දී ඒවායේ වගා බිම් සකස් කිරීම සඳහා මී ගවයින් යොදා ගෙන තිබෙන්නේ 20% ක් පමණි. 70% ක් ම භාවිතා කර තිබෙන්නේ ට්‍රැක්ටර් ය (අබේරත්න, 1984).

කෘෂි අංශයේ කටයුතු සඳහා සතුන්ගේ ශ්‍රමය හා උදැල්ල, දැකැත්ත වැනි උපාංග වෙනුවට මෙලෙස ශ්‍රී ලංකාවේ වී වගා කටයුතු සඳහා තාක්‍ෂණික මෙවලම් භාවිතය ආරම්භ වන්නේ 1940 දශකයේ අග භාගයේ දී යි. ඒ මෙරටට රෝද දෙකේ සහ රෝද හතරේ ට්‍රැක්ටර් හඳුන්වා දීමත් සමග යි. මෙම තාක්‍ෂණික මෙවලම් මූලික වශයෙන් ම යොදා ගැනුණේ වී වගාවේ බිම් සැකසීමේ කටයුතු සඳහා යි.

1950 දශකයේ මැද භාගය වන විට ඉහළ ඵලදායිතාවයකින් යුත් වී වර්ග භාවිතය ආරම්භ වන්නට විය. ඒ සඳහා බිම් සැකසීම ඉතා ඉහළ ගුණාත්මක භාවයකින් සිදු කළ යුතු විය. මන්ද නව බීජයන්ට සම්ප්‍රදායික බීජ වර්ගයන්ට මෙන් වල් පැළ සමග තරග කිරීමේ හැකියාව නොමැති වීම හේතුවෙනි. වියළි කලාපයේ භූමිය තද බවින් යුක්ත බැවින් වල් පැළ උදුරා දැමීම මෙන් ම පස පෙරළීම සඳහා ඉහළ බලයක් යෙදවීමට අවශ්‍ය වේ. එමෙන් ම, වඩා ජනප්‍රිය ඉහළ ඵලදායිතාවයකින් යුත් එච් 4 වී වර්ගයේ ගොයම් සම්ප්‍රදායික ක්‍රමයට පෑගීම අසීරු මෙන් ම ඵලදායිතාවයෙන් ද අඩු ය. භූමි සැකසීම සඳහා යොදා ගැණුනු අක්ෂ දෙකේ ට්‍රැක්ටරය මෙම තත්ත්වයන් මගහරවා ගැනීමට උපකාර විය. ඒ අනුව ක්‍රමයෙන් කොළ මැඩීමේ කාර්ය සඳහා ද ට්‍රැක්ටරය වඩාත් ගොවීන් අතර ජනප්‍රිය වන්නට විය.

මෙම යන්ත්‍ර මෙරට ට හඳුන්වා දීමේ මූලික ම අරමුණ වූයේ, කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා යි. එහි දී විදේශීය සහනාධාර සපයන ආයතන විසින් සහනදායී මිල ගණන් යටතේ ශ්‍රී ලංකාවට ට්‍රැක්ටර් ප්‍රදානය කරන ලදී. රෝද දෙකේ ට්‍රැක්ටර් ලියාපදිංචිය මෙරට ආරම්භ වූයේ 1973 වර්ෂයේ සිට යි.

1977 එවකට පැවති රජය විසින් හඳුන්වා දෙනු ලැබූ විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් සමග ම කෘෂිකාර්මික කටයුතු සඳහා උපයෝගී කරගන්නා යන්ත්‍ර සූත්‍ර මෙරටට ගෙන්වීම බහුලව සිදුවන්නට විය. අද වනවිට ලොව පුරා සිදුවන තාක්‍ෂණික හුවමාරුවත් සමග මිනිස් ශ්‍රමය අභිබවා යමින් යන්ත්‍ර සූත්‍රවල අවශ්‍යතාවය මිනිසාට දැනෙන්නට පටන් ගෙන ඇත.

ලෝකය දියුණුවත් ම මිනිසා එදිනෙදා වැඩකටයුතු වඩා පහසුවෙන් කරගැනීමේ විවිධ ක්‍රමෝපායන් සෙවීමට උත්සාහ කරයි. එය විටෙක රටක සංවර්ධිත මට්ටම පෙන්නුම් කෙරෙන මිනුම් දණ්ඩක් වැනි ය. කෙසේ වෙතත්, අද

වනවිට මිනිසාගේ කාර්යභාරය ඉක්මවා යමින් ඒ වෙනුවට යන්ත්‍රෝපකරණ සඳහා ප්‍රමුඛස්ථානයක් හිමි වී තිබේ. අද වන විට මිනිසාගේ එදිනෙදා ජීවිතයට සේම කෘෂි අංශය තුළට ද විවිධාකාර වූ යන්ත්‍රෝපකරණ හඳුන්වා දී තිබේ. එදා මිනිසුන් 10-15 දිනක් කළ යුතු වූ වැඩ අද යන්ත්‍රයක් යොදා ගනිමින් පැයක් තුළ සිදු කොට අවසන් කිරීමට හැකි වී ඇත.

කෘෂිකර්මාන්ත අංශයට තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳව වඩා වැඩි අවධානයක් යොමු වන්නට වූයේ 1960 ගණන්වල සිදු වූ හරිත විප්ලවයත් සමග යි. එහි දී මිනිස් ශ්‍රමය මගින් සිදු කෙරෙන බිම් සැකසීම, සී සෑම, කොළ මැඩීම හා වී සුළං කිරීම යන කාර්යයන් සඳහා මිනිස් ශ්‍රමය වෙනුවට ට්‍රැක්ටරය ආදේශ විය. මෙම තාක්ෂණික මෙවලම් හඳුන්වා දීමත් සමග මිනිස් ශ්‍රමයේ අවශ්‍යතාවය සැලකිය යුතු මට්ටමකින් අඩු විය. තාක්ෂණික මෙවලම් හඳුන්වාදීමත් සමග ම වී වගාවේ නිෂ්පාදනය ඉහළ යාමට එය සෘජුව ම බලපෑ අතර, ක්‍රමයෙන් තාක්ෂණය දියුණු වත් ම විවිධ කාර්යයන් සඳහා වඩා ඵලදායී ආකාරයේ යන්ත්‍ර සූත්‍ර බිහි වන්නට විය. ඒ අනුව ශ්‍රමය යොදා සිදු කෙරුණු බිම් සැකසීම, සී සෑම, ගොයම් පෑගීම, වී සුළං කිරීම යනාදී කාර්යයන් සඳහා ට්‍රැක්ටරය ද ගොයම් කැපීම, කොළ මැඩීම යන කාර්යයන් සඳහා බහුකාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍රය ද හඳුන්වා දෙන ලදී.

1970 දශකයේ මුල් භාගයේ දී තල 14 කින් යුත් භ්‍රමණය වන රෝද සහිත අශ්ව බල 7 කින් යුත් ඩීසල් බලයෙන් ක්‍රියාත්මක එන්ජිමක් සහිත ට්‍රැක්ටරයට සවි කළ හැකි උපකරණයක් හඳුන්වා දෙන ලදී. එය වඩා කාර්යක්ෂමතාවකින් යුක්ත විය. එමෙන් ම, ඒ සඳහා මූලික ව වැය කළ යුතු මිල අඩුවීමත්, ඉන්ධන පිරිමැසීමේ හැකියාවත් නිසා ගොවීන්ට එය වඩාත් ඵලදායී ආයෝජනයක් විය. මේ ආකාරයෙන් ක්‍රමක්‍රමයෙන් වී වගාව සඳහා ට්‍රැක්ටර් භාවිතයේ සිට බහු කාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍ර, බහු කාර්ය කොළ මැඩීමේ යන්ත්‍ර භාවිතය දක්වා වර්ධනය විය.

විශේෂයෙන් ම කෘෂි අංශයේ ශ්‍රමිකයින් සොයා ගැනීමට තිබූ දුෂ්කරතාවයන් හේතුවෙන් කෘෂි අංශය යාන්ත්‍රීකරණයට ලක් වූ අතර ම, අඩු වියදමකින් අඩු කාලයක් තුළ ගොවීන්ට තම අවශ්‍යතාවයන් ඉටු කරගැනීමට තිබූ හැකියාව ද එහි ඇති ඉහළ කාර්යක්ෂමතාවය ද හේතුවෙන් කෘෂි අංශයේ යාන්ත්‍රීකරණය ඉහළ යාමට හේතු සාධක විය. මේ තුළ විශාල ශ්‍රම ඉතිරියක් සිදු විය. වී නිෂ්පාදනයේ දී අස්වනු නෙළා ගැනීම, කොළ මැඩීම හා වී සුළං කිරීම කුඹුරේ දී සිදු කෙරෙන අවසන් කාර්යයන් කිහිපය යි. එමෙන් ම වී වගාවේ යෙදෙන ගොවීන්ට මෙන්ම කම්කරුවන්ට ද තම ආදායම් උපයා ගැනීමේ අවස්ථාවන් උදා වන්නේ ද මෙම අවස්ථාවන් වල දී ය. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වශයෙන් එතෙක් අස්වනු නෙළීම සඳහා දෑකැත්තත්, කොළ මැඩීම සඳහා ට්‍රැක්ටරය හෝ අඩු ධාරිතාවකින් යුත් කොළ මැඩීමේ යන්ත්‍ර ද භාවිතා කෙරිණි. වී සුළං කිරීම සඳහා ට්‍රැක්ටරයට සවි කරන ලද සුළං පෙත්තක් මගින් හෝ අතින් ක්‍රියා කරවන සුළං පෙත්තක් උපයෝගී කර ගැනිණි.

ගොවිතැන පුරාණයේ සිට ශ්‍රී ලාංකීය ජනතාව වෙත කෙතරම් බැඳී පැවතුණේ ද යත් පුරාණ පවුල් ඒකකය ගොඩනැගුණේ ද කෘෂිකර්මාන්තය පදනම් කරගෙන ය. එදා තම කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රම අවශ්‍යතාවය සපයා ගැනුණේ පවුල් ඒකකය තුළින් ම වීම සුවිශේෂී අංගයකි. එහෙත් අද වන විට කෘෂි අංශයේ විශේෂයෙන් වී ගොවිතැන ආශ්‍රිතව ශ්‍රමය පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් පැන නැගී ඇත. එනම් මිනිස් ශ්‍රමය අභිබවා යමින් තාක්ෂණික මෙවලම් භාවිතය ඉතා ඉහළ මට්ටමක පැවතීම හේතුවෙනි.

### "සුනාමි" හා "භූතයා"

වී වගාව සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීම පිළිබඳ ව පර්යේෂණ අධ්‍යයනයන් ගණනාවක් සිදු කර ඇති අතර, ඒවායෙන් බොහෝ දුරට ගම්‍ය වන්නේ යන්ත්‍ර සූත්‍ර භාවිතය ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති බව යි. එමෙන් ම, මෙම යන්ත්‍ර සූත්‍ර භාවිතය ඉහළ යාමත් සමග ම ශ්‍රම වෙළඳපොළ කෙරෙහි එහි යම් බලපෑමක් සිදු වී ඇති ආකාරය බොහෝ අධ්‍යයනයන්ගෙන් සනාථ වී තිබේ. ගෝලීයකරණයේ ප්‍රතිඵල වන තාක්ෂණික හුවමාරුවේ ප්‍රතිඵලයක් ලෙසත් කෘෂි අංශය තුළ යන්ත්‍රෝපකරණ භාවිතය සුලභ වන්නට විය. ආසියාවේ වේගවත් සංවර්ධනයක් ළඟා කරගනිමින් සිටින චීනය තුළ කෘෂි අංශය යාන්ත්‍රීකරණය වීමත් සමග එහි වූ අතිරික්ත ශ්‍රමය ක්‍රමයෙන් කාර්මික හා සේවා අංශයන් වෙත විතැන් වීමක් පෙන්නුම් කෙරේ. ඔවුන් ඒ හරහා තම ආර්ථික සංවර්ධන ඉලක්කයන් සපුරා ගනිමින් සිටී.

මේ ආකාරයට වී අස්වැන්න නෙළීමේ කාර්ය සඳහා හඳුන්වා දී ඇති නවීනතම උපකරණයන් දෙකක් වන්නේ බහුකාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍රය (Combine

harvester) හා බහුකාර්ය කොළ මැඩීමේ යන්ත්‍රය යි (Combine thesher). ගොවීන් අතර මෙම යන්ත්‍ර දෙක වඩාත් ජනප්‍රිය වී තිබෙන්නේ "භූතයා" හා "සුනාමි" යන්ත්‍රය ලෙස යි. "භූතයා" හෙවත් බහු කාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍රය මගින් ගොයම් කපා පැගී අස්වැන්න පිරිසිදුව ලබාගත හැක. එහි දී ඉවත්වන පිදුරු සියල්ල කුඹුර පුරා විසිරී යයි. එය කුඹුරේ සාරවත්භාවය රැක ගැනීමට මහඟු පිටුවහලකි. බහුකාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍රය භාවිතයේ දී පිදුරු කුඹුර පුරා විසිරී යයි. මෙම යන්ත්‍රය භාවිතයේ දී ගොවීන්ට වඩාත් පහසු වී තිබෙන්නේ ඉතා කෙටිකාලයක් තුළ අස්වැන්න නෙළාගත හැකි වීම යි. විශේෂයෙන් ම ක්ෂණික කාලගුණික විපර්යාසයන්ට මුහුණදීමට සිදුවන මෙවන් කාල වකවානුවක ගොවීන්ට අස්වැන්න නෙළා ගෙට ගැනීම දක්වා වූ දීර්ඝ ක්‍රියාවලියේ අවධානම මෙම යන්ත්‍රය භාවිතයත් සමග අවම වී ඇත. එය ගොවියාගේ හිස මත වූ විශාල බරක් සැහැල්ලු වීමකි. අනෙක් අතට ගොවීන් අද මුහුණ පා ඇති ප්‍රධානතම ගැටළුවක් වී තිබෙන්නේ ශ්‍රම හිඟය යි. මේ තත්ත්වය වී අස්වනු නෙළන සමයේ දී කුරුණෑගල, පොළොන්නරුව, අනුරාධපුර, අම්පාර වැනි ප්‍රදේශවල තදින් ම දැකගත හැකි තත්ත්වයකි. මාස ගණනාවක් තම ශ්‍රමය හා මුදල් වැය කොට අස්වද්දා ගත් කුඹුරේ අස්වැන්න නිසි කලට නෙළා නො ගත්තේ නම් ගොවි මහතුන්ගේ සම්පූර්ණ ශ්‍රමය මෙන් ම විශාල ධනස්කන්ධයක් ද අපතේ යයි. එමෙන් ම නිසි කලට වේලාවට අස්වැන්න නෙළා නො ගැනීම හේතුවෙන් වීවල ගුණාත්මකභාවය මෙන්ම ප්‍රමාණාත්මකභාවයට ද හානි සිදු වේ. එහෙත් මෙම නවීන යන්ත්‍රය පැමිණීමත් සමග ශ්‍රම හිඟය නිසා ගොවීන් මුහුණ දී සිටි බරපතල ගැටළුවට සහනදායී පිළිතුරක් ලැබී තිබේ.

ජී. එම්. හේනෙගෙදර විසින් 2008 දී සිදු කරන ලද අධ්‍යයනයක් තුළින් කෘෂි අංශය යාන්ත්‍රීකරණය වීම පිළිබඳ ව අවධානය යොමු කර තිබේ. එම අධ්‍යයනයට අනුව, ට්‍රැක්ටරයකින් අක්කරයක අස්වනු නෙළීමට හා කොළ මැඩීමට ආසන්න වශයෙන් මිනිස් දින 14 ක් අවශ්‍ය වන අතර ඒ සඳහා බහු කාර්ය කොළ මැඩීමේ යන්ත්‍රයකට අවශ්‍ය වන්නේ මිනිස් දින 10 කි. බහු කාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍රයකට කුඹුරු අක්කරයක අස්වනු නෙළීමට හා කොළ මැඩීමට අවශ්‍ය වන්නේ මිනිස් දින 2 ක් පමණි. මේ අනුව බහු කාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍රය යොදා ගැනීමෙන් මිනිස් දින 8 ක් ඉතිරි කර ගත හැක. මේ අනුව පැහැදිලි වන්නේ කෘෂි අංශය යාන්ත්‍රීකරණය වීමෙන් විශාල ශ්‍රමයක් ඉතිරි කරගත හැකි බව යි.

ඉහත අධ්‍යයනයෙන් කෘෂි අංශය යාන්ත්‍රීකරණය වීම හේතුවෙන් වී වගාවේ හා බඩ ඉරිඟු වගාව සඳහා අවශ්‍ය කම්කරු අවශ්‍යතාවය සෘජු ලෙස ම අඩුවීමක් පෙන්නුම් කරන බව තහවුරු වී තිබේ. ඒ තාක්ෂණික මෙවලම් භාවිතය ඉහළ යාම හේතුවෙනි.

ප්‍රනාන්දු සහ පලිපාන (1983) විසින් ඉදිරිපත් කර ඇති පර්යේෂණ ග්‍රන්ථයක් මගින් වී වගාවේ ශ්‍රම භාවිතය පිළිබඳ කරුණු දක්වා ඇත. අස්වනු නෙළීම, කොළ මැඩීම හා වී සුළං කිරීම යන කාර්යයන් සඳහා මුළු මිනිස් ශ්‍රමයෙන් 53% ක් පමණ වැය වේ. එනම්, කෙටි කාලසීමාවක් තුළ විශාල ශ්‍රම අවශ්‍යතාවයක් අස්වනු නෙළීම ආරම්භයේ සිටම අවශ්‍ය වේ. මේ සඳහා මුළු නිෂ්පාදන පිරිවැයෙන් 26% ක් පමණ වැය වේ. නිසි කලට අස්වනු නෙළීමට නො හැකි වීම මෙන් ම නිසි කලට පෙර අස්වනු නෙළීමේ දී ගොවීන්ට තම අස්වැන්නේ ගුණාත්මකභාවය මෙන් ම ප්‍රමාණාත්මකභාවය ද රැක ගැනීම අපහසු වේ. වී අස්වනු නෙළීමේ දී ගොවීන් මුහුණ දෙන ප්‍රධානතම ගැටලුව වන්නේ ශ්‍රම හිඟය යි. මේ හේතුව නිසාම ශ්‍රී ලංකාවේ වී අස්වැන්නේ පසු අස්වනු නාස්තිය මුළු නිෂ්පාදනයෙන් 15% ක් පමණ වන බව ගණන් බලා ඇත.

## යාන්ත්‍රීකරණය සමග අභියෝග

මේ ආකාරයට නවීන තාක්ෂණය හා බද්ධ වෙමින් ගොවි ජනතාව පෙරට වඩා විශාල නිදහසක් තම ගොවිතැන්වල දී විඳින ආකාරයක් දැකගත හැකි වුවත් ඇතැමුන් මෙම යන්ත්‍රය භාවිතය ප්‍රතික්ෂේප කරන අවස්ථා ද පොළොන්නරුව, අම්පාර හා හම්බන්තොට ප්‍රදේශයන්වල කළ සංචාරයක දී අපට දැකගත හැකි විය. ඔවුන් ප්‍රකාශ කරන ආකාරයට මෙම යන්ත්‍රය භාවිතය හේතුවෙන් යම් යම් අවාසි සහගත තත්ත්වයක් ද උද්ගත වී තිබේ. ගොවි මහතුන් ප්‍රකාශ කරන ආකාරයට බහුකාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍රය භාවිතය මගින් විශාල අස්වනු නාස්තියක් සිදුවන බවට මැසිවිලි නැගේ. ඔවුන් දක්වන ආකාරයට එය අක්කරයකට බුසල් 7 ත් 8 ත් අතර ප්‍රමාණයකි. මෙම යන්ත්‍රය විශාලත්වයෙන් මෙන්ම බරෙන් වැඩි නිසා කුඹුරේ පස තදවන බවට ද ගොවීන් මැසිවිලි නගයි. ඒ නිසා ඊළඟ කන්නයේ සී සෑමේදී වඩා වැඩි මුදලක් දැරීමට ඔවුන්ට සිදුවී ඇත. මේ ආකාරයට යම් යම් මැසිවිලි නැඟුන ද අප කළ සංචාරයේ දී අනාවරණය වූයේ මෙම යන්ත්‍ර භාවිතයට ගොවීන් වැඩි කැමැත්තක් දක්වන බවයි.

වී ගොවිතැනේ පහසුව සඳහා කුඹුරුවලට පැමිණි අනෙක් ආගන්තුකයා වන්නේ බහු කාර්ය කොළ මැඩීමේ යන්ත්‍රය හෙවත් "සුනාමි" යන්ත්‍රය යි. මෙම යන්ත්‍රය භාවිතයේ දී කම්කරුවන් ලවා ගොයම් කැපිය යුතු ය. අනතුරුව යන්ත්‍රය මගින් ගොයම් පාගා ඒ තුළ දී ම වී සුළං වී ඇසුරුම් තුළට පැමිණේ. මේ යන්ත්‍රය භාවිතයේ දී තවදුරටත් ශ්‍රමය අත්‍යාවශ්‍ය සාධකයක් වේ. බහුකාර්ය කොළ මැඩීමේ යන්ත්‍රය මගින් අස්වැන්න ලබා ගැනීමේ කාර්ය සඳහා ශ්‍රමිකයින් හත්දෙනෙකුගේ සහභාගිත්වය අවශ්‍ය වුවත් බහුකාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍රය භාවිතයේ දී අවශ්‍ය වන්නේ එක් ශ්‍රමිකයකු පමණි. බහුකාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍රය හෙවත් "භූතයා" භාවිතයේ දී සිදුවන අවාසි සහගත තත්ත්වයන් මග හරවා ගැනීමේ විකල්පයක් ලෙස බහුකාර්ය කොළ මැඩීමේ යන්ත්‍රය ඇතැම් ගොවීන් භාවිතා කළ ද ශ්‍රම හිඟය තුළ නැවතත් වැඩි ඉල්ලුමක් ලැබෙන්නේ බහුකාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍ර සඳහා යි.

බහු කාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍රය භාවිතය නිසා ගොවීන්ට මුහුණදීමට සිදුව ඇති තවත් ගැටළුවක් අපට හඳුනාගත හැකි වුයේ අම්පාර දිස්ත්‍රික්කයෙනි. එනම් කුඹුරුවල පෙරට වඩා වල් පැළ පැතිරී යාමේ ප්‍රවණතාවයක් දැකගත හැකිවීම යි. ගොවීන් සඳහන් කළ ආකාරයට මෙම යන්ත්‍ර භාවිතයේ දී පිදුරු කුඹුර පුරා විසිරීමේ දී වල් බීජ ද ඒවා සමගම කුඹුර පුරා පැතිර යයි. එහි දී ගොයම් පැළ සමග වල් මර්දනය ද යන්ත්‍ර භාවිතයත් සමග වැඩි වී තිබේ. එමෙන්ම මේ තත්ත්වය පොළොන්නරුව ප්‍රදේශයේ ද තරමක් දුරට අපට හඳුනාගත හැකි විය. මන්ද ගොයම් කැපෙන කාලයේ දී අම්පාර, මඩකලපුව වැනි ප්‍රදේශවලින් බහුකාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍ර පැමිණේ. එහි දී එම ප්‍රදේශවල පවතින වල් පැළ වර්ග පොළොන්නරුව ප්‍රදේශය තුළ ද පැතිර ඇති ආකාරය දැකගත හැකි විය.

ගොවීන් අතර මහත් ආන්දෝලනයකට තුඩු දී ඇති මෙම බහුකාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍ර පැමිණීමත් සමග පැන නැගී ඇති තවත් ගැටළුවක් වන්නේ තරගකාරී මිල යි. කිසිදු පාලනයකින් තොරව මෙම යන්ත්‍රය සඳහා මිල ගණන් නියම වන අතර, ඉන් වැඩි වාසියක් අත්ව තිබෙන්නේ අතරමැදියන්ට ය. එනම් වෙනත් ප්‍රදේශවලින් පැමිණෙන යන්ත්‍ර අදාළ ගමේ තැරැව්කරුවකු මාර්ගයෙන් ගොවීන් විසින් ලබාගත යුතු අතර එම තැරැව්කරුට ගොවියා අක්කරයකට රු.500.00 ක මුදලක් ගෙවිය යුතු ය. තම ශ්‍රමය හා ධනය වැය කොට රටටම බත සපයන ගොවීන් මෙහි දී පත්වන්නේ දැඩි අසීරුතාවකට වුවත්, පවතින තත්ත්වයන් යටතේ වෙනත් කළ හැකි යමක් නො වන නිසාවෙන් ම මෙම ක්‍රමවේදයටම ඔවුන් අනුගත වෙමින් සිටී. මෙහි දී ඔවුන් පවසන්නේ රජයේ මැදිහත් වීමෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන හෝ ගොවි සංවිධාන හරහා හෝ මෙම යන්ත්‍ර භාවිතය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් විය යුතු බව යි.

තාක්‍ෂණය යනු මිනිසාගේ වැඩ කටයුතු පහසු කිරීමේ මගක් මෙන් ම ඒ තුළින් ලැබෙන වාසිය රටේ සියළුදෙනාට ම සමස්තයක් ලෙස හිමි විය යුතු ය. එහෙත් බහුකාර්ය අස්වනු නෙළීමේ යන්ත්‍රය මගින් ලබා ගන්නා අස්වැන්න තෙත ගතියකින් යුතු නිසා ගොවීන් කුඹුරේදීම තම අස්වැන්න අලෙවි කරනු ලබයි. එහි දී ඔවුන්ට හිමි වන්නේ වෙළඳපොලේ වී කිලෝවක් සඳහා පවතින මිලට වඩා රුපියලක් හෝ දෙකක් අඩුවෙනි. එහි දී නැවතත් ගොවියා අසරණ තත්වයට පත් වන්නේ වී අලෙවි නො කර තම ණය මුදල් පියවා ගත නො හැකි නිසා වෙනි. ඒ අනුව ගොවීන්ට අස්වැන්න කල් තබාගෙන ඉහළ මිලක් ලැබෙන තුරු බලා සිටීමේ හැකියාව නො පවතී. ඒ අනුව නැවතත් ගොවියා ගොවියකු වීම නිසා ම අසරණ තත්ත්වයකට පත් වී ඇත.

මේ සියළු ගැටළු ගොවීන් හමුවේ ඇතත් ඔවුන් කිසි විටෙකත් මෙම යන්ත්‍ර භාවිතය ප්‍රතික්ෂේප නො කරන්නේ පවතින දැඩි ශ්‍රම හිඟය හේතුවෙනි. එමෙන් ම, ගොවීන්ට අවශ්‍ය වන්නේ ද තම අස්වැන්න වර්ෂාවට ප්‍රථමයෙන් නෙළා අවසන් කර ගැනීම යි. ඒ නිසාම යන්ත්‍රෝපකරණ භාවිතය හා ඉන් වන හානි හඳුනාගෙන ඒවා වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා අවශ්‍ය වන විසඳුම් සෙවීම වැදගත් වේ.

දිනෙන් දින යාන්ත්‍රීකරණය වන කෘෂි කර්මාන්තය තුළ මෙම යන්ත්‍රෝපකරණවලින් බැහැරවීම කිසිසේත් ම අපේක්‍ෂා කළ නො හැක. එය විය යුත්තේ මෙම යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් සිදුවන හානි හඳුනාගෙන ඒවාට පිළියම් සෙවීම යි.

**ඉන්දිකා පතිරණ**
පර්යේෂණ නිළධාරිණී
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.